අප අතරින් සැලකිය යුතු ප්‍රමාණයක් යම් කිසි තාවකාලික හෝ දීර්ඝකාලීන හෝ ස්ථිර ආබාධයක්/ආබාධයන් සහිතව ජීවත් වෙති. ඔවුන්ව හැඳින්වීමේදී -විශේෂයෙන්ම මාධ්‍යකරණයේදී- කිසිදු වෙනස් ලෙසින් සැලකීමකට හෝ කොන් වීමකට බඳුන් නොකෙරෙන භාෂාවක් භාවිතා කිරීම පිළිබඳ සංවාද ගෝලීය මට්ටමෙන් සිදුවේ. එහිදී අපට එකඟ විය හැකි කරුණක් වන්නේ, ආබාධ සහිත අය පිළිබඳව සඳහන් කිරීමේදී පුද්ගල-මූලික භාෂාවක් යොදාගැනීම උචිත බවයි.

පුද්ගල-මූලික භාෂාවක් (Person-first language) යනු කුමක්ද? පුද්ගල-මූලික භාෂාවක ප්‍රධාන අදහස වන්නේ, ආබාධය හෝ තත්වය පිළිබඳව සඳහන් කිරීමට පෙරාතුව, එම පුද්ගලයාව ප්‍රමුඛ කොට පිළිගැනීමයි. උදාහරණයක් ලෙසින් ගත් විට, Disabled person වැනි යෙදුමක් වෙනුවට Person with a disability යන්න යොදාගැනීම දැක්විය හැක. එය ඔවුන්ගේ ගරුත්වය ආරක්ෂා කිරීමට මෙන්ම යම් කිසි බලාපොරොත්තු සහගත බවක් ලබාදීමටද උපකාරී වනු ඇත.

මෙසේ ගත් විට, 'ආබාධිත' යන යෙදුමට වෙනුවට වඩා යෝග්‍ය වන්නේ 'ආබාධ සහිත'/'ආබාධයක් සහිත' යන්න නොවේද? එසේ නැතිනම් ඒ සඳහා වඩාත් යෝග්‍ය යෙදුමක් ඔබට යෝජනා කළ හැකිද?

මූලාශ්‍ර:

https://lagunashoresrecovery.com/what-is-person-first-language/
https://adata.org/factsheet/ADANN-writing
http://www.disability.wa.gov.au/Global/Publications/Understanding%20disability/words_that_work_media_guide.pdf

#MediaEthicsSL #lka #SinhalaPress #Divaina #Mawbima #SathiAgaAruna